කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (නව නිර්දේශය)

# අභිලේඛන, සංස්කෘතිය හා ජනශ්‍රැතිය SINH – E3025

පළමුවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් එක් ප්‍රශ්නයක් ද, දෙවන හා තෙවන කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

## 1 කොටස

01. පහත සඳහන් ශිලා ලේඛන පාඨවල අදහස ලිහිල් බසින් ලියන්න.

අ) බඩගරික - ගමික - අනුඩිය කටිත උපශික - තිශය ලෙණ ශගශ

[ගමණි] - උති - දෙව [න] පි[ය] - මහරකඩහ කඩ [ය] ශුමන - දෙවිය
ලෙණෙ අගත - අනගත චතු - දිශ - ශගශ

පරුමක - නග - පුත පරුමක - පිගල - ගුතස ලෙණෙ
අගත - අනගත චතු - දිස - සඝස දිනෙ

පරුමක - සෙන - පුත බඩකරික - පරුමක - සෙනහ ලෙණෙ
සගස

(ලකුණු 08)

ආ) බයලි දස අමණ ඉව/ මෙ දෙ හකඩ දස අ-
-මණක වි පිටදඩ - හසහි වෙඪ අකල - හසහි වෙඪ ම-
-දෙ - හසහි වෙඪ පචවිසිය අමණක වි ඉව මෙ ස අමණක උදිහි
වෙඪ එක අමණ දෙ පෙකඩක උදි ඉව දස අමණක බයලිහි වෙඪ
/දෙ අ-
-මණ දෙ පෙකඩක බයලි ඉව / මෙ වතක වණහි ගහෙ කිණිය
චිටවය වෙ-
ඪ ගෙණ තිණඩ හකට දන-වට ඉව අතරකජක-වට ඉව අතරකජ
(පරි)කර-යපෙනි ඉව දි මිය වට පෙණි තිල ඉව බුනතෙල ඉව
ලොණ ඉව
පලහ-වට ඉව වෙටයල ඉව වහෙර ... ග සර ප ... පවනහි
මිලිය පදිය ඉව

(ලකුණු 08)

ඇ) රජ්මහවෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා
මෙහෙණිවර්හි ඉසා සඟ් සතු පුගුල් සතු ලාහ

යෙහි ඉසා බජ් තුවාක් ගම්බිමට් රජ්කොල් කැමියන් වැදු
වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා ඉසා ගස්කො-

ළ් නොකපනු ඉසා මෙලාට්සී නොවද්නා ඉසා මිනී කෙටූ
කෙනෙකුන් ඇත ගමට් වැදූ ඔවුන් මැ ඉල්ලමුත් සෙසු-

එහි නොපහළ් සෙසු කුඩීනට් අනියා නොකරනු ඉසා දෙදෙ
හවුරුද්දෙන් ගොස් රජ්කොල් සම්දරුවන් රට් ඉල්ලා

(පස්) මහ සාවද්දූ වරජ් ඉල්ලමුත් සෙසු වරද් නො ඉල්ලනු
ඉසා පෙරෙ කැමියන් ගම් දන්නාසෙ දඬ ගෙනැ

පැට්වූ වරදට් වටාලා දඬ නොගන්නා ඉසා ඇත්වෙහෙර
ගම්බිමින් ගත් හැමැ දඬ ඇත්වෙහෙර කම් න

වාමට් දෙනු ඉසා පෙරෙ නොවත් විරි තැනට් පෙරෙ නාට්ටියම්
නොවද්නා ඉසා රට් පටවන්නට් ගිය රජ්කොල්

සම්දරුවන් ගත් දඬැ ගිඟිරියක් ඇත සම්දරුවන් දඬ නායකයන්
හින්දූ විචාරකොට් හැරියැ යුතුවක් හර්නා ඉසා (ලකුණු 08)

ඈ) අණ මැකුවත් රත්කළ යමර වැඩි(ෙ)ය සිට්වනු කො
ට් ඉසා මෙ දස ගැ(මැ කුඩීන්) තමන් තමන් කුලෙහි (වැ
ටෙ)න මඟුලවමඟුල වලන්ද්නා පැරහැර නො ඉක්මැ
වැටෙනු කොට් ඉසා මෙ දසගමට් (වැවස්ථා) කළ තැනි
න් (එකෙක) අවුද් (වුන්) කු(ඩී) කෙනෙකුන් ඇත හැන්දිනැ ඇ
(පැ) ගෙනැ හිනද්වනු කොට් ඉසා නො යෙදෙන්නක් කොට්
වන් කෙනෙකුන් ඇත ඇපැ ගතදූ පළමුවූ ගැමැ ඇ(ත්ත)
න්) පට්වන්නට් හර්නා කොට් ඉසා (ලකුණු 08)

<u>නැතහොත්</u>

පහත සඳහන් ශිලා ලිපි කියවා වර්තමාන සිංහල අකුරෙන් ලියන්න.



(ලකුණු 08)

02. ලාංකේය ලේඛන කලාවේ ආරම්භය පිළිබඳ විමසීමක් කරන්න.

03. අතීත ලංකාවේ සමාජ තොරතුරු පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් සෙල්ලිපිවලින් සැපයෙන පිටුබලය ඔබට නියමිත සෙල්ලිපි අසුරෙන් විමසන්න.

04. පහත සඳහන් එක් ශිලාලිපියක් පිළිබඳ ප්‍රාමාණික සටහන් ලියන්න.

- i. තෝනිගල ගිරිලිපිය
- ii. V වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය
- iii. වේවැල්කැටිය ශිලා ලිපිය

## II කොටස

05. දෙස් විදෙස් විද්වතුන්ගේ අර්ථ නිරූපණ කෙරෙහි අවධානය යොමු කරමින් සංස්කෘතිය හා එහි ව්‍යුහය පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. මහනුවර යුගයේ සිංහල සමාජ සංවිධානය හා කුලක්‍රමය අතර පැවතියේ කෙබඳු සබඳතාවක් දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

07. ලක්දේසීන්ගේ බලපෑමෙන් සිංහල සංස්කෘතියට එක් වූ නවාංග කවරේ දැ' යි නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

## III කොටස

08. ජනශ්‍රැතිය යන්න පැහැදිලි කර එහි ප්‍රමුඛාංගයක් වන ජනකවිය මගින් සිංහල ජනජීවිතය අධ්‍යයනය කිරීමෙහි ලා සැපයෙන පිටුබලය කෙබඳු දැ'යි සාකච්ඡා කරන්න.

09. සිංහල ජනකතා වර්ගීකරණයකට ලක්කොට ඉන් එක් ප්‍රභේදයක් පිළිබඳ විස්තරයක් කරන්න.

නැතහොත්

තුරුලතා සම්බන්ධයෙන් වූ මිනිසාගේ සියුම් නිරීක්ෂණ හා සංවේදනා වෘක්ෂශ්‍රැතිවල නිරූපණය වන ආකාරය පැහැදිලි කරන්න.

10. 'නිමිති ශාස්ත්‍රය වූ කලී ශාස්ත්‍රීය පදනමකින් තොර මිත්‍යා මත පදනම් කරගත් අභිචාර විශේෂයකි.'' මේ ප්‍රකාශයෙහි යුක්තියුක්තතාව පරීක්ෂා කරන්න.

(02 වන පිළිතුරේ සිට 10 වන පිළිතුර දක්වා සෑම පිළිතුරකටම ලකුණු 17 බැගිනි.)